0159

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| නර්තනය (භරත) I<br>நாட்டியம் (பரதம்) I<br>Dancing (Bharatha) I | 53 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන වරණවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** නටරාජා මූර්ති දර්ශනයේ තෝන්බිකල් පෙන්වීම සඳහා වූ ලක්ෂණය වන්නේ,
(1) කපාලමාලෙ ය. (2) පාම්බනී ය.
(3) තිරුවාසි ය. (4) මුයලකන් ය.
(5) තෝඩුම් කුලෙයුම් ය.

**2.** "හරි රිග ...." යන්නෙන් ආරම්භ වන අෂ්ටපතිහි "හරි" යන අභිනය ඉදිරිපත් කිරීම සඳහා භාවිත කරන මුද්‍රා වන්නේ,
(1) ත්‍රිපතාක, ත්‍රිපතාක ය. (2) පතාක, පතාක ය.
(3) මයූර, මයූර ය. (4) අර්ධපතාක, අර්ධපතාක ය.
(5) අර්ධචන්ද්‍ර, අර්ධචන්ද්‍ර ය.

**3.** මිශ්‍ර ජාති ද්‍රවතාල අංග විදහා දැක්වෙන සැකසුම වන්නේ,
(1) $I_7OI_7$ ය. (2) $I_7OI_7I_7$ ය. (3) $I_7I_7OO$ ය. (4) $I_7OO$ ය. (5) $I_7OI_7I_7$ ය.

**4.** ගෞතම බුදුරජාණන් වහන්සේ අගය කර වර්ණනා කරමින් නර්තනය කරන වන්නම,
(1) අසදෘෂ වන්නම ය. (2) ඊරඩි වන්නම ය.
(3) සුරපති වන්නම ය. (4) වෛරෝඩි වන්නම ය.
(5) උරග වන්නම ය.

**5.** පාදභේදාහි මණ්ඩල භේදා කොටස් ගණන
(1) 05 කි. (2) 06 කි. (3) 08 කි. (4) 09 කි. (5) 10 කි.

**6.** වෙරළබඩ ප්‍රදේශවල නර්තනය සඳහා භාවිත කරන සංගීත භාණ්ඩය වන්නේ,
(1) කවෙල ය. (2) ගැටබෙරය ය.
(3) සල්ලාරි ය. (4) කොම්බු ය.
(5) පරෙරේ ය.

**7.** එකොළොස් නර්තන වර්ගවලට ඇතුළත් කුඩමාඩල් නැටුම් ශිල්පියා වන්නේ,
(1) සිව දෙවියන් ය. (2) කතරගම දෙවියන් ය.
(3) කාම දෙවියන් ය. (4) තිරුමාල් දෙවියන් ය.
(5) භාරති ය.

**8.** කෘෂිකාර්මිකයන් විසින් බොහෝදුරට වාදනය කරන වාදන භාණ්ඩය වන්නේ,
(1) පරෙර ය. (2) තප්පු ය. (3) මත්තලම ය.
(4) සෙමක්කලම ය. (5) සවනික්කෙ ය.

**9.** තුණංගෙ කුතුවල විශේෂයෙන් සඳහන් වන සංක යුගයේ ග්‍රන්ථ වන්නේ,
(1) නට්ට්‍රිනෙ සහ කලිතොගෙ ය.
(2) අගනානූරු සහ පුරනානූරු ය.
(3) පරිපාඩල් සහ පදිට්ට්‍රපත්තු ය.
(4) මදුරෛකාංචි සහ පෙරුම්පානාට්ට්‍රපඩෛ ය.
(5) පට්ටිනප්පාලෙ සහ කුත්තරාට්ට්‍රපඩෛ ය.

**10.** තාල දසප්‍රානම්හි "+" යන සංකේතයෙන් විදහා දැක්වෙන්නේ,
(1) ගුරු ය. (2) ප්ලුත ය. (3) ධ්‍රැතවිරාම ය. (4) කාකපාද ය. (5) ලඝුද්‍රැත ය.

**11.** "කුන්ජන් නම්බියාර්" නිර්මාණය කළ නර්තනය වන්නේ,
(1) තුල්ලල් ය. (2) තරංගම් ය. (3) රාස ය.
(4) සලනම් ය. (5) සිපිතාංගා ය.

**12.** රාසා, රිද්මයානුකූල තාලයට රජෙකු මෙන් ඇවිදිමින් කරන නර්තනය වන්නේ,
(1) පරෙරමේල කුතු ය. (2) මගඩින් කුතු ය.
(3) තෙන්මොඩි කුතු ය. (4) මලෛයෙකම් කුතු ය.
(5) වාසාප්පු කුතු ය.

**13.** සමන චිත්‍ර සහ කල්ප සුත්තිරම් වැනි ලේඛනවල දැකිය හැකි ශාස්ත්‍රීය නර්තන වර්ග වන්නේ,
(1) කතකලි ය. (2) කතක් ය. (3) ඔඩිසි ය.
(4) කුචිප්පුඩි ය. (5) මණිපුරි ය.

**14.** සාමාන්‍ය නායකීගේ නායකයා වන්නේ,
(1) පති ය. (2) උපපති ය. (3) වෛසිකන් ය.
(4) විඩන් ය. (5) සේඩන් ය.

**15.** පළවෙනි 'දිත් තෙයින්ද තා තෙයි' අඩව්වෙහි පිටුපස කොටස එක් කරන උත්ප්ලවන භේදය වන්නේ,
(1) අලකම් ය. (2) කර්තරී ය. (3) අශ්වෝත්ප්ලවනම් ය.
(4) ක්‍රැපාලකම්දික්යාර්තම් ය. (5) මෝඩිතම් ය.

**16.** 'නඩබාලා' පෙන්වාදෙන ශාස්ත්‍රීය නර්තනය වන්නේ,
(1) ඔඩිසි ය. (2) කතකලි ය. (3) භරත නාට්‍යය ය.
(4) මෝහිනිආට්ටම් ය. (5) මණිපුරි ය.

**17.** "සංගීතකායකාමිරුතවර්ෂිනී සහ සංගීතසූර බූෂනී" යන ග්‍රන්ථ කතෘවරයා වන්නේ,
(1) දණ්ඩායුදබානි පිල්ලෙයි ය. (2) අරුණාචල නට්ටුවනාර් ය.
(3) සුබ්බරාය නට්ටුවනාර් ය. (4) ගංගෛමුත්තු නට්ටුවනාර් ය.
(5) ඌත්තුකාඩු වේංකඩ සුප්බයියර් ය.

**18.** භාවාභිනය යනු,
(1) ශාරීරික අංග ඕනෑම දෙයක් අත්, පාද අනිවාර්යෙන්ම භාවිත කර අභිනය කිරීම ය.
(2) හිස, ඇස්, පාද, අත් යන ඒවා කුමකින් හෝ ඉදිරිපත් කිරීම ය.
(3) හිස සහ ඇස් භාවිත කර අභිනය කිරීම ය.
(4) ලොව ඇති සියලු ද්‍රව්‍ය, වාචිකව සඳහන් කිරීමෙන් තොරව නර්තනයෙන් පෙන්නුම් කිරීම ය.
(5) පරුව කාලයට අයත් මුද්‍රා භාවිත කර නර්තනය කිරීම ය.

[තුන්වැනි පිටුව බලන්න

**19.** වීර රසයෙහි ව්‍යභිසාරිභාව වන්නේ,
(1) සන්තෝෂය, හැඟීම් පිබිදීම සහ කැළඹීම ය.
(2) සාංකාව, විරහව සහ ව්‍යාකූලබව ය.
(3) ලැජ්ජාව, උත්සාහය සහ සාංකාව ය.
(4) වෙහෙස, සැකය සහ ඉවසීම ය.
(5) ශෝකය, භය සහ දුක ය.

**20.** තකතදිංගිනතොම්, ගිනතොම්, තදිංගිනතොම්, තකදිකුතදිංගිනතොම්, ගිනතොම් යන අවසාන තීර්මාණම් සැකසී ඇති යදි සැලැස්ම වන්නේ,
(1) සමයදි ය. (2) මිරුතංග යදි ය. (3) විසමයදි ය.
(4) පර්වතයදි ය. (5) ඩමරුගයදි ය.

**21.** තිල්ලානා නර්තන අංගය සැකසීමේදී සුවිශේෂී කොටස වන්නේ,
(1) තීර්මාණම් ය. (2) අරුදි ය. (3) මෛයි අඩව් ය.
(4) කෝර්වෛ ය. (5) උසිකෝර්වෛ ය.

**22.** අභිනයම්හි නයම් යනු
(1) රසයයි. (2) ළඟාවීමයි.
(3) මවා පෙන්වීමයි. (4) ඉදිරියයි.
(5) ස්ථාවරයයි.

**23.** තමාගේ ආසාව ඉෂ්ඨ කරගැනීමට නොහැකිව දැන දුකට පත්වී සිටින නායිකී වන්නේ,
(1) ප්‍රෝෂිතබර්තුකා ය. (2) අභිසාරිකා ය. (3) විප්‍රලබ්දා ය.
(4) විරහෝත්කන්ඩිනා ය. (5) වාසකසජ්ජිකා ය.

**24.** "නෙට්ට්‍රන්දි නේරත්තිලෙ......." යන පදම්හි විදහා දැක්වෙන "වෙට්ට්‍රිමාමයිල් ඒරුම් කන්දා නීර් අවලුම් එදිර් මොලියායි නිට්කෙයිලේ සොක්කෙයිලේ පක්කත්තිල් ඉරින්දේන් සුවාමි" යන ගීත කොටසේ කියැවෙන නායිකී වන්නේ,
(1) වාසකසජ්ජිකා ය. (2) කණ්ඩිතා ය. (3) අභිසාරිකා ය.
(4) ස්වාධීනපතිකා ය. (5) විප්‍රලබ්දා ය.

**25.** නායකීට නායකයා පිළිබඳව අවස්ථානුකූලව පවසන්නේ,
(1) ඉලිංකිනි ය. (2) සේඩි ය. (3) සිල්පිනි ය. (4) දාසි ය. (5) ප්‍රාතිවේසිනි ය.

**26.** 'මානික්ක මකාගේ' යනුවෙන් හඳුන්වන දේවදාසීන් විසින් කළ නර්තනය වන්නේ,
(1) පාසරඹ නර්තනයයි. (2) පහතරට නර්තනයයි.
(3) තික්කෙයි නර්තනයයි. (4) වෙස් නර්තනයයි.
(5) උඩරට නර්තනයයි.

**27.** සංකීර්ණ ජාති ජම්ප තාලය, සංකීර්ණ ගදි බවට මාරුවන විට ඇතිවන එකතුව
(1) 99 කි. (2) 108 කි. (3) 180 කි. (4) 198 කි. (5) 261 කි.

**28.** මිරුච්ච කඩිකම් යන නාට්‍යයෙහි 'වසන්ත සේනා' ලෙස රඟ දැක්වූ, සම්බන්ධ මුදලියාරින්ගේ පැසසුමට ලක් වූ පුද්ගලයා වන්නේ,
(1) පන්දනෙ නල්ලූර් සභාරත්ජිතම් ය. (2) සුප්පරාය නට්ටුවනාර් ය. (3) ගෞරි අම්මාල් ය.
(4) රුක්මණී දේවි අරුන්ඩේල් ය. (5) ඊ. ක්‍රිෂ්ණයියර් ය.

**29.** ශබ්ද සැකසීමේදී ග්‍රාමීය නර්තනය සඳහා සංකේත ලෙස භාවිත කරන්නේ,
(1) මගිඩි ශබ්දයයි. (2) කිංකිණි ශබ්දයයි.
(3) නෛයාන්ඩි මේල ශබ්දයයි. (4) පරෛ ශබ්දයයි.
(5) බස්සාගේ ශබ්දයයි.

**30.** වේෂ නිරූපණයේදී මුහුණේ තෙල් ගතිය ඉවත් කිරීමට භාවිත කරන්නේ,

(1) පෑන්කේක් ය. (2) මොයිස්චරයිසර් ය. (3) පවුඩර් ය.
(4) ටෝනර් ය. (5) මේකප් මාස්ක් ය.

**31.** ධර්මය, පුරුෂාර්ථ ලෙස තබාගැනීමට ෂඩ්ජමම් සහ රිෂබම් ස්වර ලෙස ගෙන එන රසය වන්නේ,

(1) ශෘංගාර ය. (2) ශාන්ත ය. (3) වීර ය.
(4) රෞද්‍ර ය. (5) අත්භූත ය.

**32.** ;;, ත, තිං, කි, න, තොම් ත, / තිං
කි, න, තොම් ත / , තිං, කි, න, තොම් //
යන තදිංකින තොම් සැකසුම නිර්මාණය වී ඇති ජාති වන්නේ

(1) කණ්ඩ ය. (2) මිශ්‍ර ය. (3) තිශ්‍ර ය.
(4) චතුස්‍ර ය. (5) සංකීර්ණ ය.

**33.** "අරංගියල් මගලිර්ක්හු ආඩල් වතුක්කුම් තලෛකෝල් පෙන්ඩීර්" යන ගායනය හරහා තලෛකෝලියර්වරුන් නැටුම් ගුරුවරුන් ලෙස හැඳින්වෙන්නේ,

(1) සිලප්පතිකාරම්වල ය. (2) පෙරුංකදෛවල ය. (3) පරිපාඩල්වල ය.
(4) පංජමරබුවල ය. (5) කුත්තනූල්වල ය.

**34.** තිරිවුඩ රාසප්ප කවිරායිරුට 'කුරවංජි මේවු' යන තංජෙ භූමිය ප්‍රදානය කළ පුද්ගලයා වන්නේ,

(1) රගුනාද නායක්කර් ය. (2) සෙවප්ප නායක්කර් ය.
(3) මුත්තු විසයරංග සොක්කනාද නායකර් ය. (4) විජයරාගව නායකර් ය.
(5) ක්‍රිෂ්ණා දේවරායර් ය.

**35.** සම්යෝග ශෘංගාරයෙහි "කිලකිංජිත" යන්නෙන් දැක්වෙන්නේ,

(1) කාන්තාවගේ චරිතය පෙම්වතෙකු ලෙස රඟ දැක්වීම ය.
(2) තමාගේ අලංකාරය වැඩි කර ගැනීම සඳහා ආභරණ මාරු කිරීම ය.
(3) කාන්තාවන්ගේ අලංකාර ශෘංගාර ලීලාව ය.
(4) කෝපය, සන්තෝෂය, භය යනාදිය එකතුවීමෙන් නිර්මාණය වන හැඟීම් ය.
(5) ආදරවන්තයා ගැන සඳහන් කිරීමේදී ප්‍රේමණීය අදහස් ඇති කර ගැනීම ය.

**36.** සැමදෙනා සමගම සන්තෝෂයෙන් සහ සාමදානයෙන් කටයුතු කරන්නා,

(1) තීරෝදාත්තන් ය. (2) දීරෝතදන් ය. (3) දීරලලිතන් ය.
(4) දීරශාන්තන් ය. (5) දීරකාන්තන් ය.

**37.** නායක යුගයෙහි නර්තනශාලා පිළිබඳව වර්ණනා සඳහන් කරන කාව්‍ය සංග්‍රහය වන්නේ,

(1) රගුනාත රාමායනයයි. (2) චතුර්දණ්ඩි ප්‍රකාශිකායි.
(3) රගුනාදාජ්‍යුතයායි. (4) රාජ්‍ය ගෝපාල විලාසයි.
(5) මන්නාරු දාස විලාසයි.

**38.** මෝහිණී නර්තනය පිළිබඳව සඳහන් වන සාහිත්‍ය වන්නේ,

(1) ව්‍යවහාර මාල ය. (2) හස්තලක්ෂණ දීපිකා ය.
(3) සෞතන්ය චරිතාම්රුකම් ය. (4) උෂාබ් පරිණයම් ය.
(5) චතුර්දණ්ඩි ප්‍රකාශිකා ය.

**39.** "කණ්ණනිඩම් සොල්ලඩි - සකියෙ
තිණ්ණමුඩන් එන් මැනතිලෙ සොල්ලඩි" යන ගායනයේ එන 'කණ්ණනෙයි' අභිනය සඳහා භාවිත කරන හස්ත මුද්‍රා වන්නේ,

(1) ශිකර සහ ත්‍රිෂුල (2) තිරිප්පදාහම් සහ සිම්හමුඛ
(3) හම්සාස්සිය සහ චතුර (4) මෘගශිර්ෂ සහ මෘගශිර්ෂ
(5) මුෂ්ටි, අලපද්ම

**40.** ශිව දෙවියන්, තණ්ඩු මුනිවරයාට නර්තනය ඉගැන්වීම පෙන්නුම් කරන මූර්තිය දැකිය හැකි ස්ථානය වන්නේ,
(1) තන්ජෙ පෙරුම් කෝවිල ය. (2) මාමල්ලපුරම් ය.
(3) චිදම්බරම් ය. (4) තාරාසුරම් ය.
(5) කුම්බකෝනම් සාරංගපාණි ය.

- අංක **41** සිට **45** දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

| පියාගේ නම | කලාකරු | ආරම්භක නර්තන ගුරුතුමා | කලා මෙහෙවර | විපත |
|---|---|---|---|---|
| A | ක්‍රිෂ්ණාඅයියර් | මදුරාන්තකම් ජගදම්බාල් | භරත නර්තන කලාවේ පුනර්ජීවනය සඳහා දායකත්වය, තමිල්නාඩුවේ “භරත නාට්ටියමුම් පිර නඩනමුම්” යන ග්‍රන්ථය රචනා කිරීම | 1968 |
| සුබ්බරායර් | B | සුබ්බරායර් | අඩව් 10, අඩව් 120 ක් දක්වා පුළුල් කිරීම, නර්තන ප්‍රසංග ක්‍රමානුකූලව සැකසීම | 1864 |
| නාගම්බුජම් | සභාරන්ජිතම් | C | පන්දනෙ නල්ලූර් ශෛලිය ප්‍රචලිත කිරීම, අඩව් නර්තනය කළ රුක්මිණී දේවියට උපකාර කිරීම | 2000 |
| නීලකන්ඩ ශාස්ත්‍රී | රුක්මණී දේවි අරුන්ඩේල් | මෛලාපූර් ගෞරිඅම්මාල් | D | 1986 |
| ගෝවින්ද රාජා | බාලසරස්වතී | මෛලාපූර් ගෞරිඅම්මාල් | ‘භරත නාට්‍යම්’ යන ග්‍රන්ථය රාගවන් සමඟ රචනා කිරීම | E |

**41.** **A** හි ඇතුළත් විය යුතු පියාගේ නම වන්නේ,
(1) අරුණාචලම් ය. (2) පාපනාසම් සිවන් ය. (3) ඊස්වර අයියර් ය.
(4) අම්බුජම් ය. (5) සභාරන්ජිතම් ය.

**42.** **B** හි ඇතුළත් විය යුතු කලාකරු වන්නේ,
(1) අරුණාචල නට්ටුවනාර් ය. (2) ක්‍රිෂ්ණාඅයියර් ය.
(3) මීනාක්ෂි සුන්දරම්පිල්ලෙයි ය. (4) පොන්නයියා ය.
(5) රාමයියාපිල්ලෙයි ය.

**43.** **C** හි ඇතුළත් විය යුතු ආරම්භක නර්තන ගුරුවරයා වන්නේ,
(1) මෛයලාපූර් ගෞරිඅම්මාල් ය. (2) කලානිදි නාරායනන් ය. (3) රාමයියාපිල්ලෙයි ය.
(4) සුබ්බරායර් ය. (5) දණ්ඩායුධ පානිප්පිල්ලෙයි ය.

**44.** **D** හි ඇතුළත් විය යුතු කලා මෙහෙවර වන්නේ,
(1) “සංගීත සුර බූසනී” යන ග්‍රන්ථය රචනා කිරීම ය.
(2) කලාක්ෂේත්‍රා යන ආයතනය පිහිටුවීම ය.
(3) සමකාල ‘ඉසෛ චිත්තකර්හර්’ යන ලිපිය ලිවීම ය.
(4) අලුත් තීර්මානම් සහ ගණිතකරණය කර ලය සකස් කිරීම ය.
(5) තිරු මයිලෙක් කුරුවන්ජි නර්තන නාට්‍ය රචනා කිරීම ය.


**45.** **E** හි ඇතුළත් විය යුතු විපතට අදාළ වර්ෂය කුමක් ද?
(1) 1884 (2) 1981 (3) 1982 (4) 1984 (5) 1988

**46.** මෙම රූපයෙහි දක්වා ඇති නර්තන නාට්‍යයෙහි ඇතුළත් චරිතය නිර්මාණය වීමට බලපෑ කතාව කුමක් ද?




(1) ක්‍රිෂ්ණලීලා
(2) ශිවලීලා
(3) සුයම්බුලීලා
(4) රාසලීලා
(5) මංගලලීලා

**47.** මෙම රූපයෙහි දක්වා ඇති තාල වාද්‍ය භාණ්ඩය යොදාගන්නා ශාස්ත්‍රීය නර්තනය වන්නේ,




(1) භරත නාට්‍යයම් ය.
(2) මඩිසි ය.
(3) කතකලි ය.
(4) කුච්චිපුඩි ය.
(5) මණිපුරි ය.

**48.** මෙහි දක්වා ඇති ආභරණ ඇතුළත් කොටස



(1) ප්‍රත්‍යාංග ය.
(2) අංග ය.
(3) උපාංග ය.
(4) ෂඩාංග ය.
(5) සෝඩෂාංග ය.

**49.** මෙහි දක්වා ඇති දෙවියන් පෙන්නුම් කරන රසය වන්නේ,



(1) හාස්‍ය ය.
(2) රෞද්‍ර ය.
(3) කරුණා ය.
(4) අද්භූද ය.
(5) ශෘංගාරය ය.

**50.** මෙහි දක්වා ඇති ශාස්ත්‍රීය නර්තනයෙහි ඇතුළත් තාණ්ඩවමහි පැනීම වන්නේ,



(1) පරන් ය.
(2) තුක්කඩා ය.
(3) තුරුපත් ය.
(4) අකොංප්පා ය.
(5) චෙර්වා ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

නර්තනය (භරත) II
நாட்டியம் (பரதம்) II
Dancing (Bharatha) II

53 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

✻ I කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) ඔබ ඉගෙනගත් පදවර්ණම්හි රාගය සහ තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඔබ ඉගෙනගත් පදවර්ණම්හි සතරවෙනි චරනස්වර කෝර්වෙහි තාලය, අංග සංකේත සමග ලියන්න. (ලකුණු 10යි.)
   (iii) ඔබ ඉගෙනගත් තිල්ලානාහි රාගය සහ තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)
   (iv) ඔබ ඉගෙනගත් තිල්ලානාහි ඇතුළත් දෙවෙනි පල්ලවි කෝර්වෙහි තාලය, අංග සංකේත සමග ලියන්න. (ලකුණු 06යි.)

2. (i) කුච්චිපුඩි නර්තන ශිල්පීන් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න. (ලකුණු 02යි.)
   (ii) කුච්චිපුඩි නර්තනය සඳහා භාවිත කරන සංගීත භාණ්ඩ **හයක්** සඳහන් කරන්න. (ලකුණු 03යි.)
   (iii) කුච්චිපුඩි නර්තන නාට්‍ය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (iv) කතක් නර්තනයෙහි ආරම්භය සහ සංවර්ධනය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) කතක් නර්තනයෙහි නර්තන ක්‍රම පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05යි.)

3. (i) නව රසවලට අයත් විභාව, අනුභාව, ව්‍යභිචාරිභාව, සාත්විකභාව යන ඒවා වගුගත කර පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)
   (ii) තාල 35, තාල 175 බවට පත්වන ක්‍රමය වගුගත කර පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

## II කොටස

4. (i) වඩමොඩි කුතු සඳහා භාවිත කරන ඉතිහාස කථා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි.)
   (ii) වාසප්පු කුත්තු පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   (iii) ඒන්දල් නඩනම් (ද්‍රව්‍ය භාවිතයට ගනිමින් කරන නර්තනය) පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 03යි.)
   (iv) කුට්ට්‍රාල කුරවඤ්ජි නර්තන නාට්‍යයෙහි පහත සඳහන් කොටස් පැහැදිලි කරන්න.
      (අ) ගායන සැකසුම (ලකුණු 05යි.)
      (ආ) නාට්‍ය සැකසුම (ලකුණු 06යි.)

[ දෙවැනි පිටුව බලන්න.

**5.** (i) සංක කාලයට අයත් නර්තනයන්හි කුරවෛ, තුණංගෛ, වෙරියාට්ට යන ඒවා පිළිබඳව වෙන වෙනම සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) සිලපතිකාරම්හි සඳහන් කර ඇති සංගීත ගුරුවරයා, කවිඥන් ආට්ට්‍රල්, තන්නුමෛ වාදකයා බටනලා සංගීතිකාව, යාල් ගුරුවරයා, වේදිකා සැකසුම යන ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**6.** (i) පන්දනෛනල්ලූර් සබාරංජිතම් ගේ ජීවන ඉතිහාසය සහ කලාව සඳහා කළ සේවාව පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) අරුණාචල නට්රුවනාර්ගේ කලා කටයුතු විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**7.** තිරුත්ත, නිරුත්තිය භාරත නර්තන අංග නර්තනයේදී සිසුන් මුහුණපාන අභියෝග පිළිබඳව රචනාවක් ලියන්න. (ලකුණු 20යි.)

**8.** පහත සඳහන් කරුණු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) නව රසයන්හි රාග

(ii) බ්‍රමරි භේදා

(iii) නඩරාජ මූර්ති දර්ශනයේ තිරුවෙන්නීරු

(iv) සිංදු වන්නම් (ලකුණු 05 × 04 = 20යි.)

* * *